# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.

**ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE UNION**

**அனைத்து இலங்கை சமுர்தி மேம்பாடு (வங்கிகள் நிறுவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்**

**ලි.ප. අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com**

අංක , 68 දෙහිදෙනිය ,පේරාදෙනිය

எண் 68, டெஹிடேனியா, பெரடெனியா


2021.06.01

සමෘද්ධි බැංකු,බැංකු සමිති,ක්ෂේත්‍ර

සමෘද්ධි සංවර්ධන නිළධාරී සහෝදරය/සහෝදරිය,

ලෝක ව්‍යසනයක් පවතින මෙම කාල වකවානුව අප විසින් ඉතාමත් සුපරික්ෂා කාරීව රාජකාරී කටයුතු සිදුකළයුතු බව පලමුව ඔබ සියලු දෙනාට මෙයින් දන්වා සිටිමි.එසේ වුවද සමෘද්ධි සංවර්ධන නිළධාරීන් වන අපහට ලැබියයුතු මේවන විටත් අප වෘත්තීය සමිතිය ඉහල නිළධාරීන් සමඟ සාකච්ඡා කර ඉදිරිපත්කර ඇති සියලුම ඉල්ලීම් දිනෙන් ප්‍රමාද වෙමින් පවතී.මෙයට හේතුව වී ඇත්තේ අප සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ගේ ක්‍රියාකළාපයන්ම බව පෙන්වා දෙමි.අප නිළධාරීන් බහුතරයක් වෘත්තීය සමිති වලට බනිමින් වෘත්තිය සමිති විසින් ගනුලබන වෘත්තීය ක්‍රියා මාර්ග මුදලට පාවා දෙමින් කටයුතු කිරීම තුලින් වෘත්තීය සමිති හැල්ලුවට ලක්කිරීමත් පාලක පක්ෂයට ආවැඩීමක් බවත් තේරුම් ගත යුතුය. සමෘද්ධි සංවර්ධන නිළධාරීන්වන ඔබ සැම දෙනාම දැනගතයුතුම කාරණාව වනුයේ වෘත්තීය සමිතියක් යනු ඔබවිසින් පත්කරණු ලබන ලේකම්,සභාපති,භාණ්ඩාගාරික ඇතුළු විධායක සභාවට අයත් නිළධාරීන් කණ්ඩායම නොවන බවයි.ඔවුන් ඔබගේ ගැටළු පාලක පක්ෂයට ඉදිරිපත් කිරීමටත් ඒවාට විසඳුම් ලබාගැනීම සඳහා අවශ්‍ය වන්නාවූ විවිධ උපායමාර්ග තෝරන හා ක්‍රියාවට නැන්වීමට ඔබට නායකත්වය සපයන කණ්ඩායමයි.අපගේ ඉල්ලීම් දිනාගැනීමට නම් ඔබවෙනුවෙන් ඉදිරිපත් වන එම නායකත්වය විශ්වාස කිරීමත් ඔවුන්ට ශක්තිය ලබාදීමත් අනිවාර්යයෙන්ම ඔබ විසින් කළයුතු ප්‍රධානතම කාර්ය භාරය බව වටහාගත යුතුය.එසේ කිරීම සඳහා ඔබ අනිවාර්යයෙන්ම ඔබට නිවැරදිව නායකත්වය ලබාදෙන වෘත්තීය සමිතියක සාමාජිකයකු විය යුතුය.මෙය ඔබ තේරුම් නොගෙන කිසිඳු වෘත්තීය සමිතියක සාමාජිකත්වය නොගෙන සිටින තෙක් ඔබට සිදුවනුයේ 2021.04.12 හා 13 දිනත් 2021.05.24 හා 25 දිනවලත් කටයුතු කළ ආකාරයට ප්‍රාදේශීය ලේකම් වරුන්ටත් විශේෂයෙන්ම කළමණාකරුවන්ටත් යටත් වී ඔවුන්ගේ පදයට නටමින් තමන් නියෝජනය කරණු ලබන වෘත්තීය සමිති හා වෘත්තීය ක්‍රියාමාර්ග පාවාදීමටය.එය තමාටම වලකපා ගැනීමක් බව තේරුම් ගත යුතුය.

2021.04.12 හා 13 යන දින දෙක සමෘද්ධි බැංකු විවෘත්ත කර රුපියල් 5000 ක දීමනාව බෙදාදීමට කටයුතු කරණ ලෙසට අප හට දන්වා තිබුනි.එහෙත් එම කාලවකවානුව තුල එවැනි දෙයක් කිසිවකු බලාපොරොත්තු නොවූ දෙයකි.රජයේ අවශ්‍යතාවය නිසාවෙන්ම මෙම කටයුත්ත සිදුවන බැවින් අපගේ ඉල්ලීම් වෙනුවෙන් හඩක් නැගීමට සුදුසුම කාලය මෙය නිසා ඔබට නිවැරදිව නායකත්වය ලබාදෙන වෘත්තීය සමිතියක් වශයෙන් එයට අප සංගමය විරෝධතාවය පප්‍රකාශ කරමින් සමෘද්ධි බැංකු විවෘත්ත නොකරණ බව පාලනාධිකාරියට දැනුම් දෙන ලදී.මේ සම්බන්ධයෙන් අප සංගමය කළමණාකරුවන්ගේ සංගමය සමඟ ද සාකච්ඡා කළ අතර එම දිනදෙක ඔවුන් සේවය කිරීම සිදුකරණ බව ප්‍රකාශ කරණ ලදී.මෙම කටයුත්ත සඳහා ඔවුන් ඉදිරිපත් වූයේ තම සාමාජිකයන්ගේ ඉල්ලීම් කිහිපයක් මුල් කරගෙනබව අප සංගමයට අවබෝධ විය.එසේම වෘත්තීය සංගමවල සාමාජිකත්වය ලබාගෙන නැති සමෘද්ධි සංවර්ධන නිළධාරී පිරිසක්ද කළමණාකරුවන්ගේ හා ප්‍රාදේශීය ලේකම් වරුන්ගේ බලපෑම් වලට යටවූ පිරිසක්ද නිවාඩු දින දීමනාවට යටවූ තවත් පිරිසක්ද වශයෙන් බහුතරයක් සමෘද්ධි සංවර්ධන නිළධාරීන් තම පංතියේ වෘත්තීය


සභාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දූ:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දූ:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ජේ.වී.බස්නායක
දූ:අං: 071-8191473

උප සභාපති
ටී.ජී.දයාවංශ
දූ:අං: 071-2585394

උප ලේකම්
බී.ඩී.ජී.වික්‍රමසිංහ
දූ:අං:076-5566136

ජාතික සංවිධායක
එච්.ජී.සරත්
දූ:අං:071-8105051

සංගම් තීන්දු පසෙකලා සැමදාම මෙන්ම කළමණාකරුවන් සමඟ එකතු විය.එහි ප්‍රතිඵලය වූයේ අප නිළධාරීන් මොනදේ අහිමිවුවත් සොච්චම් මුදලක් ලබා දුන් විට පාලනාධිකාරියේ අවශ්‍යතාවය ඉටුකරදෙන පිරිසක් බව ඔවුන්ට ඒත්තු ගැනිවීමයි. නමුත් ඔවුන්ගේ බලපෑම් වලට යටත් නොවූ මෙහි සැබෑ ස්භාවය අවබෝධ කරගත් සමෘද්ධි සංවර්ධන නිළධාරීන් හා කළමණාකරුවන් පිරිසක් අපහට සහයෝගය ලබාදෙන ලදී.ඔවුන්ට අප සංගමයේ හෘදයාංගම ස්තුතිය පුදකර සිටිමි.

ඉතිහාසයේ සිට මේදක්වාම ඔවුන්ගේ ක්‍රියාකලාපය මෙය බව ඔබට නොතෙරීම පුදුම සහගත කරුණකි.මෙවැනි පහත් තත්වයක් නිර්මානයකළේ කවුරුන්ද යන්න ඔබ දැනගතයුතුය.2005 සිට සමෘද්ධි ඇමති තුමිය සමඟ ඉතා ලඟින් කටයුතු කරමින් ඒ සඳහා අප සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ද පාවිච්චි කරමින් තම නිළධාරී කණ්ඩායමද අමතක කර එක් කොටසකට පමණක් පුද්ගලිකවනසේ උසස්වීම් සකස්කර ගත් බව ඔබ දැනගතයුතුය.එසේම අදවනවිට ඔවුන් හා අප අතර ඇතිවී තිබෙන වැටුප් විෂමතාවය පිළිබඳව කතිකා කරන්නේද වර්ෂ 10 සම්පූර්ණ / උපාධිය සපුරාඇති සමෘද්ධි සංවර්ධන නිළධාරීන්ට කළමණාකරු පත්වීම් ලබාදීමට එකඟද යන්න ඔවුන්ගේ හෘද ශාක්ෂියෙන් විමසා සිටිය යුතුය.

එසේම පරිපාලන , සැලසුම් , ගණකාධිකාරී සේවයේ ඇතැම් නිළධාරීන් මෙන්ම අපගේම වෘත්තීය සංගම්ද මෙම දෙපාර්තමේන්තුව මෙන්ම සමෘද්ධි බැංකු ස්වාධීන වනවාට අකමැති කුමණ කරුණක් පදනම් කරගෙනද යන්න සිතා බැලීමට මෙය සුදුසුම කාලයයි.2014 වර්ෂයේ අනුමත කරතිබූ නව බඳවාගැනීම් පරිපාටිය 2015 – 2019 කාලයේ සහමුලින්ම අහෝසි කිරීමට දායකවූ වෘත්තීය සමිති නායකයින් කිසිවක් නොදන්නා කිරිසප්පයෝ මෙන් හැසිරෙති.

මෙවන විට අපගේ නව නිළධාරී වැටුප , අපවෙත ලබාදියයුතු MN – 3 වැටුප් කාණ්ඩය , බැංකුවල සේවය කරණ නිළධාරීන් සඳහා ලබා දියයුතු අන්තර් ග්‍රහන පත්වීම් ලිපිය ආදී ගැටළු වලට යම් ප්‍රමාණයකින් හෝ පිළිතුරු බලාපොරොත්තුවෙන් යොමුකර ඇති පත්‍රිකා සාකච්ඡාවට ගන්නා අවස්ථාවන්හිදී අමාත්‍යාංශයේ නිළධාරීන් මුනිවත රකිමින් කොමිෂන් සභාවල තීරණයම නිවැරදි බව අපවෙත පැවසීමට උත්සහ දරමින් සිටි.එය ඔවුන්ගේ යුතුකම හා වගකීම වන්නේද?කරුණු එසේ සිදුවන්නේනම් අප විසින් සිදුකළයුත්තේ කුමක්ද?මෙම ගැටදුවලට විසඳුම් සෙවීමට ප්‍රථම අප අපගේ කාර්යභාරයන් යුතුකම් හා වගකීම් කුමක්දැයි අවබෝධ කරගත යුතුය.

වෘත්තීය සමිතියක කාර්යභාරය කුමක්ද?

වෘත්තීය සමිතියක ප්‍රධාන කාර්යයන් කිහිපයක් ඔබගේ අවධානයට හා අවබෝධයට මෙසේ දක්වා සිටිමු.

01 . සාමුහික කේවල් කිරීම.

02 . ඒකාබද්ධ සාකච්ඡාවලට සහභාගී වීම.

03 . සේවක කළමණාකරණ ප්‍රතිපත්ති , ක්‍රියාපටිපාටි යනාදිය සම්පාදනය කිරීම හා සංශෝධනය කිරීමේදී

සහභාගීත්වය සහ යෝජනා උපදෙස් ලබාදීම.

04 . වෘත්තීය ක්‍රියාමාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

මෙම කරුණු සියල්ලම වෘත්තීය සමිති නායකත්වය විසින් මේවන විටත් කිසිඳු පසුබෑමකින් තොරව සිද්දකරණු ලබන බව ඔබ වෙත දන්වා සිටිමි.එසේම මෙහි සඳහන් වෘත්තීය ක්‍රියාමාර්ග සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදුකිරීමේදී සුදුසුම අවස්ථාව මේ සඳහා යොදාගත යුතුය.එවැනි කටයුත්තක් වෘත්තීය සමිතිය විසින් දැනුම් දුන් අවස්ථාවේදී තමන් නියෝජනය කරණු ලබන ක්ශේත්‍රය (පංතිය) පිළිබඳව අප සාමාජිකයින්ට හොද අවබෝධයක් තිබිය යුතුය.තම පංතියේ අරමුණු ඉලක්ක ඉල්ලීම් මුදලට හෝ උසස් තනතුරු වලට ගිජුවී පාවා දීම සිදු නොකළ යුතුය.මෙම කරුණ වෘත්තීය සමිති සාමාජිකත්වයට මෙන්ම නායකත්වයටද අදාල වේ.ඔබ නියෝජනය කරණු ලබන්නේ අප වෘත්තීය සංගමයනම් ඔබට සතුටු විය හැක.මන්දයත් ඔබගේ නායකත්වය මේ දක්වා කිසිඳු දිනක ඔබව හෝ වෘත්තීය සමිති අරමුණු මුදලට , තනතුරුවලට හෝ දේශපාලන අරමුණු වලට පාවාදීම් සිදුකර නොමැති පිරිසක් වන බැවිනි.

අපගේ අයිතිවාසිකම් දිනාගැනීම උදෙසා දේශපාලනයෙන් තොරව ඉතාම සුදුසු අවස්ථාවේදී තීන්දු තීරණ ගතයුතු බැවින් සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් කාර්යාල හා ක්ෂේත්‍ර ) නිළධාරී සංගමය 2021.04.12 හා 13 වන දින දෙක සේවය කිරීම සම්බන්ධව ගතයුතු තීන්දු තීරණ ගනු ලැබුවේය.නමුත් මේ බැව් තේරුම් නොගත් අනෙකුත් වෘත්තීය සමිති හා අප නිළධාරීන් මෙන්ම අප සාමාජිකයින් යම් පිරිසක්ද වෘත්තීය සමිති දැනුම්දීම පසෙකලා රුපියල් ශත වෙනුවෙන් ඔබගේ අයිතිවාසිකම් පාවාදුන් බව තේරුම් ගන්න.එසේම සාමාජිකයකු සතු යුතුකම් වගකීම් හා සාමූහිකව කටයුතු කිරීමේ බලය නිවැරදිව තේරුම්ගත් අප නිළධාරී කණ්ඩායමක් අප සංගමය විසින් ගන්නා ලද තීරණ වලට ලබාදුන් සහයෝගය ඔබගේ වෘත්තීය අයිතිවාසිකම් වෙනුවෙන් සැබෑවටම පෙනී සිටින අප සංගමයට ඉදිරියේදී වුවද කාලයේදී වුවද සුදුසු හා අවශ්‍යම කාලවකවානුවලදී වෘත්තීය ක්‍රියාකාරකම් තේරීමට ලබාදුන් ශක්තියක් බවට සිහිපත් කරමු.

2021.05.24 හා 25 දෙදින දැඩි සංචරණ සීමා පනවා ඇති කාල වකවානුවක් බැවින් සමෘද්ධි බැංකු සංගම් වෙත අපගේ සේවාලාභීන් නොපැමිණෙන බවත් මෙවැනි කාලවකවානුවක් තුල වෘත්තීය ක්‍රියාමාර්ග ලවට එළඹීම තුල එම වෘත්තීය සංගමය කුමක් බලාපොරොත්තු වන්නේද කියා අප සංගමයට හොදට අවබෝධ විය.මෙම දින දෙක තුල වෘත්තීය ක්‍රියාමාර්ග තේරීමෙන් කළමණාකරුවන්ගේ වෘත්තීය සංගම් බලාපොරොත්තු වූයේ සමෘද්ධි සංවර්ධන නිළධාරීන් ඔවුන් විසින් ගනුලබන ඕනෑම තීරණයකට එකඟ බවත් එමනිසා ඔවුන් විසින් ගනුලබන වෘත්තීය ක්‍රියාමාර්ග සාර්ථක වනබවත් කුමණ හෝ පාර්ශවයකට පෙන්වා දීමටය.මෙම ක්‍රියාකාරකම් නිසා ඔබ අපගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද දිනෙන් දින අපගෙන් ඈතට පලායන දෙස බලා සිටීම හැර ලඟාකරගත නොහැකි තත්වයක් උද්ගතව ඇතිබව ඔබ සියළු දෙනාට මෙයින් පෙන්වා දෙමි.එම නිසා අපට කුමක් වීදැයි වරක් දෙවරක් නොව නිතර නිතර සිහිපත්කර වටහා ගන්න.


| සභාපති | භාණ්ඩාගාරික | ප්‍රධාන ලේකම් |
| --- | --- | --- |
| එන්.ජ්.එම්.අයි.බී.අබේසිංහ | ආර්.ඩී.කේ.සේනාධීර | බී.එම්.ජේ.වී.බස්නායක |
| දු:අං: 017-2268463 | දු:අං:071-4395535 | දු:අං: 071-8191473 |
| උප සභාපති | උප ලේකම් | ජාතික සංවිධායක |
| ටී.ජී.දයාවංශ | බී.ඩී.ජී.වික්‍රමසිංහ | එච්.ජී.සරත් |
| දු:අං: 071-2585394 | දු:අං:076-5566136 | දු:අං:071-8105051 |

# සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන (බැංකු මහ සංගම් හා කාර්යාල) නිලධාරී සංගමය.

**ALL ISLAND SAMURDHI DIWALOPMENT (BANK,MAHA SANGAM,OFFICE) OFICECES TRADE UNION**

**அனைத்து இலங்கை சமுர்தி மேம்பாடு (வங்கிகள் நிறுவனங்கள் மற்றும் அலுவலகங்கள்) அதிகாரிகள் சங்கம்**


**ලි.ප. අංකය 7570 - නිළ වෙබ් ලිපිනය - www.oisbku.com**

අංක , 68 දෙහිදෙනිය ,පේරාදෙනිය

எண் 68, டெஹிடேனியா, பெரடெனியா


2021.06.01

හිතවත් සහෝදරයා / සහෝදරිය,

එසේම අප සංගමයද මැදිහත්ව අපට සෘජුවම බලපාන ඉතා කඩිනමින් විසදා ගතයුතු ගැටළු කිහිපයක් පාලනාධිකාරිය වෙත දැනුම් දී සාකච්ඡා වෙමින් පවතින කාල වකවානුවක අප සංගමයද දැඩිලෙස මැදිහත් වෙමින් අපට ලැබියයුතු ශ්‍රේණි උසස් වීම ලබාදීමට අවශ්‍ය සියලු කටයුතු සිදුකර ඇති අවස්තාවක බොරදියේ මාළුබාමින් කටයුතු කරණ ඇතැම් වෘත්තීය සමිති අනවබොධයෙන් MN-02 ලබාදීමට ඔවුන් කටයුතු කළ බව හුවා දක්වයි.මෙය අප සිටිනා ශ්‍රේණියෙන් ඉහල ශ්‍රේණියට කරණු ලබන උසස් කිරීමක් බව අවධාරණය කර සිටිමු.එම නිසා අප වෙත ලැබියයුතු දේ බොහෝයි එය අප විසින් දිනාගතයුතුය.නමුත් ඒ සඳහා වන කාලය ඉතාමත් කෙටියි.

හිතවත් සහෝදරයා / සහෝදරිය,

දැන්වත් ඔබ කළයුත්තේ කුමක්ද යන්න හොදින් අවබෝධකර ගන්න.ඔබගේ අයිතිවාසිකම් හා වරප්‍රසාද රැකගැනීමටත් දිනාගතයුතු දේ දිනාගැනීමටත් ඔබ කටයුතු කළයුතු කාලය එළඹ ඇත.එම නිසා ඒ සඳහා ඔබ කළයුත්තේ

- ඔබ වෙනත් නිළධාරී කණ්ඩායම් වල වෘත්තීය අයිතිවාසිකම් දිනාදීම සඳහා වූ කඩේයාම දැන්වත් නවතා දමන්න.
- සටනකින් තොර ජයග්‍රහණයක් නොමැති බව තේරුම් ගන්න.
- ඒ සඳහා සියළු දෙනා එකම අරමුණක කටයුතු කළයුතු බව ද අවබෝධ කර ගන්න.
- එවිට අපට අපගේ ඉල්ලීම් ජයග්‍රහණය සඳහා මෙහෙය විය හැක.
- එම නිසා ඔබ තවමත් කිසිඳු වෘත්තීය සමිතියක සාමාජිකත්වය ලබා නොමැතිනම් අනුන් මත්තේ යැපීමට බලා නොසිට ඔබ ලබා දියයුතු දායකත්වය වෙනුවෙන් අපගේ වෘත්තීය සංගමය සමඟ අත්වැල් බැඳ ගන්න.

ප්‍රධාන ලේකම
සමස්ත ලංකා සමෘද්ධි සංවර්ධන
(බැංකු මහසංගම් හා කාර්යාල නිළධාරී සංගමය)
අංක 68 , දෙහිදෙනිය , පේරාදෙනිය

**සටනකින් තොර වෘත්තීය ජයග්‍රහන නොමැත.**
**ඒ සඳහා පෙළගැසෙන්න අප සංගමය හා එක්වන්න**
**සියළු දෙනාට ජය.**


සහාපති
එන්.ඒ.එම්.අයි.බී.අබේසිංහ
දු:අං: 017-2268463

භාණ්ඩාගාරික
ආර්.ඩී.කේ.සේනාධීර
දු:අං:071-4395535

ප්‍රධාන ලේකම්
බී.එම්.ඒ.වී.බස්නායක
දු:අං: 071-8191473

උප සභාපති
ටී.ජී.දයාවංශ
දු:අං: 071-2585394

උප ලේකම්
බී.ඩී.ජී.වික්‍රමසිංහ
දු:අං:076-5566136

ජාතික සංවිධායක
එච්.ජී.සරත්
දු:අං:071-8105051